Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය

**නීති නිලධාරි (විධායක නිලධාරි ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2017**

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුර (01) සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පරිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :

(i) *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්* :
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳව උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥයෙකු වශයෙන් වසර තුන (03) කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(iii) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iv) වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- 2017.12.31 දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් 7.2.2 සිට 7.2.3 දක්වා වූ සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. (අයදුම්පත් කැඳවන අවසන් දිනට).

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු /වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. නීති නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

(iii) 2014.01.21 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධාන අනුව හා ඊට අනුශාංගික වන චක්‍රලේඛ වල විධිවිධාන අනුව මෙම පත්වීම භාරගත් දින සිට වර්ෂ පහක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ නීති නිලධාරී තනතුරට අදාළ බඳවා ගැනීම් පරිපාටියට දැනටමත් කර ඇත්තාවූද, මතුවට කරනු ලබන්නාවූද, සංශෝධනයන්ට හා විධිවිධානයන්ට යටත් වේ.

04. *වයස් සීමාව* :
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

05. *වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව මෙම තනතුරට රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630-17 x 2,170-රු.1,10,895 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි අංක SL 1-2016 වැටුප් ඛණ්ඩයට අදළ II උපලේඛනය යටතේ රු. 36,491 ක ආරම්භක වැටුප හිමි වේ.)

06. **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පරිපාටිය පදනම් කරගනු ලැබේ.**

| අනු. අංකය | *විෂයය* | ලකුණු | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | *අතිරේක අධ්‍යාපන සුදුසුකම් :*<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය,<br>* පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>* දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා<br>* දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා<br>නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>නීති විද්‍යාලයේ අවසන් වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා<br>***සටහන*** : ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10 ලබාදිය යුතු යි.<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ. - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | 20<br>15<br>10<br>15<br>10 | 20 |
| 02 | *අතිරේක වෘත්තීය සුදුසුකම් :*<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්)<br>රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්)<br>රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03 කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | | 15 |
| 03 | *අතිරේක පළපුරුද්ද :*<br>නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද -<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක්<br>- මාස 06 ට වැඩි හා අවුරුද්දකට අඩු ලකුණු 02<br>(මූලික සුදුසුකම් ලබාගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර)<br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගෙන් හෝ ජනාධිපති නීතිඥවරයෙකුගෙන් හෝ විනිසුරුවරයෙකුගෙන් හෝ ලබාගත් අදාල කාලසීමාව හෝ කාලසීමාවන් නිශ්චිතව සඳහන් වන සහතිකයත්/සහතිකපත් මගින් පළපුරුද්ද සනාථ කළ යුතු ය.) | | 30 |
| 04 | *ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව :*<br>(උපරිම ලකුණු 15)<br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/ පශ්චාත් නීතිවේදී උපාධිය/ නීතිවේදී උපාධිය<br>(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය.)<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකයක් සඳහා (වසර 01ක් හෝ පැය 1500)<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකයක් සඳහා :<br>- මාස 06/පැය 720<br>- මාස03/පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ) | 15<br>10<br>07<br>05 | 15 |

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 05 | ***තොරතුරු තාක්‍ෂණය පිළිබඳ දැනුම***<br>(උපරිම ලකුණු 15) | | 15 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා | 15 | |
| | රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01 කට නොඅඩු (පැය 1500 ක් සඳහා) තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදරා ලබාගත් සහතිකයක් සඳහා | 10 | |
| | රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාවක් හදරා ලබාගත් සහතිකයක් සඳහා : | | |
| | මාස06/පැය 720 | 07 | |
| | මාස 03/ පැය 360 | 05 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ) | | |
| 06 | ***සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව*** | | 05 |
| | ***මුළු එකතුව*** | | 100 |

07. *අපේක්‍ෂකයින්ගේ අනන්‍යතාවය* :

- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්‍ෂකයින් පමණි.
- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්‍ෂණයේ දී සියලුම සහතිකපත්වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.
- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්‍ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

  (i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත්‍රය
  (ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. *අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය* :

(i) අයදුම්පත් 2017.12.31 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය,
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 09 දක්වාත් දෙවැනි පිටුව 10 සිට 13 දක්වාත් තෙවැනි පිටුව 14 සිට 15.2 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්‍ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රු. 47,615 ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එල්. පී. ජයම්පති,
ලේකම්,
වරාය හා නාවික කටයුතු
අමාත්‍යාංශය.

2017 නොවැම්බර් මස 14 වැනි දින,
වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය,
අංක 19,
චෛත්‍ය පාර,
කොළඹ 01.

ඇමුණුම II

**ආදර්ශ අයදුම්පත්‍රය**

*වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවත්නා නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම (විවෘත)*

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01. මුලකුරු සමඟ නම (මයා/මිය/මෙනවිය) :
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

1.1 මුලකුරු වලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරින්) :
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. උපන් දිනය :
වර්ෂය :————. මාසය :————. දිනය :————.

3.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ - M, ස්ත්‍රී - F) :————.

05. විවාහක/අවිවාහක බව :————.

06. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :
(අ) ————.
(ආ) විද්‍යුත් ලිපිනය :————.

07. දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

08. නීතිය පිළිබඳ ලබා ඇති අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර :————.

(අ) (i) විශ්ව විද්‍යාලය :——.
(ii) උපාධිය පිරිනැමූ දිනය :——.

(ආ) (i) නීති විද්‍යාලයීය ලි. ප. අංකය :———
(ii) නීති විභාගය සමත් වූ දිනය :———.

09. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය :————.

10. නීතිඥයකු ලෙස සක්‍රීය පළපුරුද්ද (වසර ගණන) :———. (කාලසීමාව හා කා යටතේ පළපුරුද්ද ලබා ගත්තේ ද යන්න සඳහන් කරන්න.)

11. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 06 ඡේදය අනුව සුදුසුකම් :-

| *අනු අංකය* | *සුදුසුකම්* | *ආයතනය* | *කාලසීමාව* |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | |
| 02 | අතිරේක වෘත්තීය සුදුසුකම් | | |
| 03 | අතිරේක පළපුරුද්ද | | |
| 04 | ඉංග්‍රීසි | | |
| 05 | තොරතුරු තාක්ෂණය | | |

12. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
ඔව්/නැත

12.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

13. අයදුම්කරුගේ සහතිකය :-

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු

වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දැන සිටිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරන බවට සහතික වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(14) අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................... නැමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු/ඇය ..................... දින මා ඉදිරිපිටදී ඉහත 13 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දුරකථන අංකය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

(15) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

15.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ, වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය, සියලු වැටුප් වර්ධක උපයා ඇත/නැත.
කිසිදු විනය දඬුවමකට ලක්වී ඇත/නැත

15.2 ඉල්ලුම් කරනු ලබන තනතුරකට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය/නොහැකිය, ඉල්ලුම්පත්‍ර නිර්දේශ කරමි/නොකරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.